# "වර්තමාන පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු ගිහි ගුරුවරයාගේ වෘත්තීයමය ගැටළු"

SCAN

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

අධ්‍යාපන පති උපාධිය (1995 / 1996)

REFERENCE ONLY

එල්.ඒ. සුනිල් ප්‍රේමරත්න

1999.06.28

64679

පර්යේෂණ සාරාංශය

වසර දහ අටක් පිරිවෙන් ගුරුවරයෙකු වශයෙන් සේවයේ යෙදී සිටීමෙන් ලත් අත්දැකීම් පදනම් කරගෙන මාගේ පර්යේෂණය සඳහා මාතෘකාව තෝරා ගත්තෙමි. එය මා නම් කරනුයේ "වර්තමාන පිරිවෙන් අධ්‍යාපන ක්ෂෙත්‍රයේ නියුතු ගිහි ගුරුවරයාගේ වෘත්තියමය ගැටළු" (තෝරාගත් දිස්ත්‍රික්කයක් ආශ්‍රයෙන් කළ අධ්‍යයනයක්) වශයෙනි. මෙහි ප්‍රධාන අරමුණු කිහිපයකි

* පිරිවෙන් ගුරු වෘත්තියේ ස්වභාවය
* පත්වීම, සේවයේ නිරත වීම, වෘත්තිය පුහුණුව, විශ්‍රාම ගැන්වීම
* පංතිකාමර ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී ගුරුවරයා මුහුණපාන ගැටළු
* ශිෂ්‍ය ඇගයීම් හා ආයතනික යන ක්ෂෙත්‍රවල ගුරුවරයා මුහුණ දෙන ගැටළු

මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා මා යොදා ගත්තේ විස්තරාත්මක පර්යේෂණ ප්‍රභේදයයි. ඒ අනුව සමීක්ෂණ ක්‍රමය භාවිතයෙන් දත්ත රැස් කර ගැනීම සිදු කළෙමි. නියැදිය සකස් කර ගැනීමේදී මහනුවර දිස්ත්‍රික්කයේ පිරිවෙන් 59න් අහඹු ලෙස පිරිවෙන් 10ක් තෝරා ගිහි ගුරුවරු 50ක් සම්බන්ධ කර ගතිමි. ඔවුනට සැපයූ ප්‍රශ්නාවලියෙන්ද, පැවැත් වූ සම්මුඛ සාකච්ඡා වලින්ද තොරතුරු ලබාගත් අතර පිරිවෙන් පනත්, නියෝගමාලා චක්‍ර ලේඛ, මේ සඳහා යොදා ගත්තෙමි.

ලබාගත් තොරතුරු සහ දත්ත ආශ්‍රයෙන් ගැටළු කිහිපයක් හඳුනා ගත්තෙමි. ඒ අතරින් ප්‍රධාන වන්නේ පිරිවෙන් ගුරුවරයාගේ වෘත්තියේ පවතින අස්ථාවර බවයි. මේ නිසා නිරන්තරයෙන්ම ඔහු සේවයේ නිරතව සිටින්නේ අකමැත්තකින් ස්වභාවයකිනි. මෙහිදී ප්‍රථමයෙන්ම කළ යුත්තේ දැනට ක්‍රියාත්මක පිරිවෙන් පනත සංශෝධනය කොට ගුරුවරයාගේ සේවා තත්වය පාසල් ගුරුවරයාට සමගාමීව ස්ථාවර කළ යුතු බව යෝජනාවක්



OPEN UNIVERSITY OF SRI LANKA LIBRARY

ලෙස දක්වමි. පිරිවෙන් ගුරුවරයාට තම වෘත්තියමය සංවර්ධනයක් ඇති
කර ගැනීම තුළින් ක්ෂෙත්‍රයේ ඉහලට යාමට නොහැකිවීම තවත් ගැටළුවකි.
උපගුරුවරයෙකු ලෙස සේවයට බැඳුනු ඔහු විශ්‍රාම යන්නේද උපගුරුවරයෙකු
ලෙසිනි. මේ සඳහා ඇති බාධක ඉවත් කිරීම සුදුසු යැයි යෝජනා කරමි.
මීට අමතරව පිරිවෙන් ගුරුවරයාගේ වෘත්තියමය පුහුණුව, ආයතනික
වශයෙන් පවතින අවිධිමත්, අසංවිධිත පරිපාලනය, පිරිවෙන් විභාග
පිළිබඳව ඇති අවතක්සේරුව, ශිෂ්‍ය සංඛ්‍යාව සෑම පන්තියකම සීමාවීම,
පිරිවෙන් අධ්‍යාපනය කාළීන නොවීම යැයි පවතින මතය වැනි කරුණුද
ගුරුවරයාගේ වෘත්තියමය ගැටළු වලට සම්බන්ධ තවත් වැදගත් සාධකයන්
ලෙස අනාවරණය විය. වැඩිදුරටත් මේ සඳහා සුදුසු තවත් යෝජනා
කිහිපයක්ම නිගමන හා යෝජනා පරිච්ඡේදයේ සඳහන්
කොට ඇත.